**ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරණ විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයේ ඡේදයට යොමුව | නිර්දේශය | සමාලෝචිත වර්ෂයේ ඡේදයට යොමුව |
|---|---|---|
| 1.6.1 (ඒ) | පුද්ගලික ඉඩම රජයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | 1.6.1 (අ)(i) |
| 1.6.1.(ඖ) | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු ය. | 1.6.1.(අ)(ii) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කාරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකර තිබූ ඉඩම පෞද්ගලික පාර්ශවයන්ට අයත්වූවද, එම දේපළවල වටිනාකම රු. මිලියන 60.14 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. කෙසේවූවද, එම ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ඉඩම අත්පත්කර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත. | ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ii) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 06 කට අයත් දේපළ වාහන සහ උපකරණ අයිතම 47 ක එකතු වටිනාකම රු.89,870,618 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ලෙස දක්වා නොතිබීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අදාල වත්කම් සිගාස් (Cigas) මෘදුකාංගයේ දත්ත ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. | පවරාගත් එම වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ (ACA – F) ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද වියදම් එකතුව රු.11,991,950 ක් දක්වා තිබුණද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA82) අනුව රු.90,206,314 ක් වූයෙන් රු.78,214,364 ක වෙනසක් නිරීක්ෂණ විය. | ස්ථාවර වත්කම් මිලදී ගැනීම් වටිනාකම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ස්ථාවර වත්කම් මිලදී ගැනීම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA82) අනුව මූල්‍ය නොවන වත්කම් අපහරණය කිරීම්වල එකතුව රු.398,085,601 ක් දක්වා තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක නව සිගාස් වත්කම් ලැයිස්තුව එකතුව රු.398,576,087 ක් වූයෙන් රු.490,486 ක වෙනසක් නිරීක්ෂණ විය. | ස්ථාවර වත්කම් අපහරණ වටිනාකම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ස්ථාවර වත්කම් අපහරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන කාර්යාල වලට අයත් වාහන 35 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වාහන 35 ක වටිනාකම තක්සේරු කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. | ස්ථාවර වත්කම් සාධාරන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ මූල්‍ය ප්‍රතිපාදන මගින් ප්‍රතිලාභීන් 2,132 දෙනෙකු වෙත ගෙවීම් කර තිබූ, ගෘහ මූලික කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නගාලීම සඳහා පොලී සහිත සහ පොලී රහිත ණය පිළිවෙලින් රු. 602,420 ක් සහ රු.32,761,569 ක මුදල ප්‍රතිලාභීන්ගෙන් අය කර නොමැතිව වර්ෂ 02 සිට වර්ෂ 12 දක්වා කාලයක් හිඟව තිබුණි. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවති. | හිඟ මුදල් අදාල කාලයතුල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 115(4),(5) | 421,109 | වර්ෂ දෙකකට ඉහත කාලයට අදාලව සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කරන ලද විවිධ කල් ඉකුත්වූ ගෙවීම් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදි අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගෙන් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV වන පරිච්ඡේදයේ 29.5.2 වගන්තිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 08 ක සේවය කරන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 11 දෙනෙකුට කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට යාම වෙනුවෙන් රාජකාරි දුම්රිය බලපත්‍ර 25 ක් නිකුත් කර තිබුණි. | ආයතන සංග්‍රහය අනුව ඉදිරියේදි සුදුසු කටයුතු කරනු ලැබේ. | කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා ගමන් වියදම් එම විභාගය සමත්වීමෙන් පසු ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 අත්තිකාරම් ගෙවීම් සහ පියවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාම ගිය නිලධාරීන් 02 දෙනෙකුගෙන් සහ මියගිය නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 721,227 ක්වූ ආපදා ණය මුදල ආයතන සංග්‍රහයෙ XXIV පරිච්ඡේදයේ 4 වැනි වගන්තිය අනුව අයකර ගැනීමට මාස 03 ක සිට අවුරුදු 03 ක් දක්වා කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම පාරිතෝෂිකයෙන් සහ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. | ආපදා ණය හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම් (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 සහ 2020 වර්ෂවල පිළිවෙලින් අමාත්‍යාංශ දෙකකින් ලබා දී තිබූ ප්‍රතිපාදන මගින් 2021 වර්ෂයේදී එකතුව රු.196,039,247 ක් වැයකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවරා නොගත් ඉඩමක ඉදිකරන ලද මට්ටුවිල් ආර්ථික මධ්‍යස්ථානය මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කර නොතිබුණි. | විදුලි පහසුකම් ලබා ගැනීමෙන් පසු මෙම මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. | ආර්ථික මධ්‍යස්ථානය මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉකුත් වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ආරම්භ කර තිබූ දේශීය නිෂ්පාදන 06 ක් ප්‍රවර්ධන කිරීම සඳහා ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සහ මිලදී ගෙන තිබූ කාර්මික උපකරණවල වටිනාකම රු.29,713,780 ක් අද දක්වා අදාල කාර්ය සඳහා යොදවා ගැනීමෙන් තොරව අත්හරින ලද තත්ත්වයේ තිබීමෙන් එම ගම්මානවල වෙසෙන අඩු ආදායම් ලාභීන්ගේ ආර්ථික තත්තවය ප්‍රවර්ධන කිරීමේ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාල කටයුතු කෙරෙමින් පවති. | දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කටයුතු සහ අදාල කර්මාන්ත උපකරණය ප්‍රයෝජනයට ගැනීමට සහ අඩු ආදායම් ප්‍රතිලාභීන්ගේ ආර්ථික තත්තවය ප්‍රවර්ධන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වැන්දඹු සහ කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නඟාලීම සඳහා ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යංශය විසින් ලබා දී තිබූ රු.1,134,171 ක මුදල අදාල ප්‍රතිලාභීන් තෝරාගෙන චක්‍රීය ණය ලබා දීමට කටයුතු නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් රජයේ බැංකු ගිණුම්වල සහ සමෘද්ධි බැංකු ගිණුම්වල වර්ෂ 02 සිට 09 දක්වා රඳවා ගෙන තිබුණි. | මෙම තැන්පත් මුදල විධිමත් පරිදි ණය ලබා දී ආපසු අයකර ගැනීමට කටයුතු කර ඇත. | අදාල ප්‍රතිලාභීන් තෝරාගෙන චක්‍රීය ණය ලබා දීමට කටයුතු කළ යුතු අතර, ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ පසු, පසුවිපරම් කිරීමේ කටයුතු සිදු කළ යුතු ය. |

**3.2 ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරුනෙල්වේලි කිරි සැකසීම් ක්‍රියාකාරකම් සඳහා කර්මාන්ත ශාලාවක් ඉදි කිරීම සහ එයට සැකසුම් උපකරණ මිලදී ගැනීම සඳහා පුද්ගලික කොන්ත්‍රාත් කරුවෙකු සමග එකතුව රු.56,640,750 ක් පිරිවැයකට 2018 වර්ෂයේ ගිවිසුම් ගතවූ ගිවිසුම අනුව දිස්ත්‍රික් ලේකම් විසින් රු.4,911,486 ක් ගෙවීම් කර තිබුණද, කොන්ත්‍රාත්කරු විසින් අදාල මූලික උපකරණ මිලදී ගෙන නොතිබීමෙන් මෙම ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.<br>කෙසේවූවද, 2019 මාර්තු 28 දින නිමකළ යුතු මෙම කර්මාන්තය නිමකර නොතිබූ අතර, එයට අදාල රු.4,822,238 ක් වටිනා කාර්ය සාධන බැඳුම්කරය මුදල් කර රජයේ ආදායමට බැරකිරීමට දිස්ත්‍රික් ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු අදාල කර්මාන්තය නියමිත කාලය තුල නොකිරීම නිසා ගිවිසුම අවලංගු කළ අතර, ඉදිරි කටයුතු කරමින් පවති. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකළ කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතු අතර, කාර්යසාධන බැඳුම්කරය මුදල් කර රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කළ යුතු ය. |

**3.3 මුදල් නිදහස් කළද, ප්‍රගතිය ලබා ගෙන නොතිබූ ව්‍යාපෘතිය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේදී රු.75,323,600 ක පිරිවැයකට නිමකළ යුතු සුන්නාකම් මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීය කරන ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු.9,368,219 ක් ගෙවීම් කර තිබුණද, අදාල කර්මාන්තය ක්‍රියාත්මක කර නොතිබීමෙන් මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීය කරනය කිරීමට නොහැකිව ඇත. | පත්කරන ලද තක්සේරු කමිටුවේ නිර්දේශය අනුව ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | අදාල කාර්යයන් නිමකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාපනය, වලිහාමම් නිරිත යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගොඩනැගිලිවල පිරිවැය එකතුව රු.48,299,000 ක් සහ 2018 වර්ෂයේ නිල සෙවන ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 07 ක එකතුව රු.30,830,235 ක් වියදමින් ඉදිකර තිබූ ග්‍රාම නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන් සඳහා කාර්යාල ගොඩනැගිලි 12 ක් ඉදිකර තිබූ ඉඩම් 2021 මාර්තු මස දිනැති 05/2021 අංක දරන ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛයේ ඡේද අංක 2.1 අනුව දිස්ත්‍රික් ලේකම්ට හෝ ප්‍රාදේශීය ලේකම්වරුන්ට අයිති වී නොතිබුණි. කෙසේවුවද, මෙම පුද්ගලික ඉඩම් රජයට පවරා ගැනීමට හෝ අත්පත්කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | අදාල කටයුතු කෙරෙමින් පවතී. | මෙම කාර්යාලවල ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ද්වීතීය මට්ටමේ කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 04 ක නිලධාරීන් 41 ක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක පුරප්පාඩුවී තිබුණු අතර, වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක එම තනතුරට අදාල නිලධාරීන් 22 දෙනෙකුගේ අතිරික්තයද තිබූ හෙයින් ඔවුන් විසින් කළ යුතු රාජකාරීන් පවරා දීමට දිස්ත්‍රික් ලේකම් විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | විවිධ හේතූන් මත කාර්ය මණ්ඩලය පැවරීම් කිරීමට නොහැකිව ඇත. | කාර්යක්ෂමතාවයෙන් කාර්ය මණ්ඩලයට රාජකාරි පැවරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක වර්ෂ 06 සිට 17 දක්වා සේවය කළ ඒකාබද්ධ සේවයේ කාර්යා මණ්ඩලයට අයත් නිලධාරීන් 123 ක් 2001 අගෝස්තු 22 දින අංක 18/2001 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ස්ථාන මාරුවීම් ලබා දීමෙන් තොරව අඛණ්ඩවම එකම සේවා ස්ථානයේ වර්ෂ 05 කට වැඩි කාලයක් සේවය කිරීමට අවස්ථා ලබා දී තිබුණි. | පළාත් පාලන ඡන්දය ප්‍රකාශ කිරීම හේතුවෙන් ස්ථාන මාරුවීම් ලබා දීමට නොහැකිව ඇත. | ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය අනුව කාර්ය මණ්ඩලය වෙත රාජකාරී පැවරීම් කිරීමට කටයුතු කළ යුතුය. |